# <u>ස්මාර්ට් වගකීම- නව කොන්දේසි සහ නීති රීති</u>

1. මෙම නව ස්මාර්ට් වගකීම් නියමයන් හා කොන්දේසි 2015 ඔක්තෝබර් මස 26 **(02 ජූලි 2015 සිට 25 ඔක්තෝබර් 2015 දක්වා වූ පැරණි ස්මාර්ට් වගකීම් පද්ධතිය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර ඇත)** වන දින සිට සිට ක්‍රියාත්මක වනු ඇත.
2. පාරිභෝගිකයන් වෙත මෙම ස්මාර්ට් වගකීමක් පිරිනැමීම ප්‍රවර්ධන කටයුත්තක් බැවින් කලින් කලට වෙනස් විය හැක.
3. ආබාන්ස් ආයතනයේන් හෝ බලයලත් අලෙවි නියෝජිතයින්ගෙන් මිලදී ගන්නා ඕනෑම LG/Lenovo and Apple ජංගම දුරකථනයක් සඳහා මෙය අදාල වේ. මෙම මාදිලි කලින් කලට වෙනස් විය හැක.
4. මිලදී ගත් දිනයේ සිට මාස හයක (06) කාලයක් තුල දුරකථනයේ අහඹු ලෙස සිදුවන වැටීමක්, කැඩීමක් හෝ ඉරිතැලීමක දී ඒ සඳහා ස්මාර්ට් වගකීම වලංගු වේ. (අංක 12 සඳහන් ප්‍රතිස්ථාපනය කිරීමේ හා මුදල් නැවත ලබා දීමේ ප්‍රතිපත්තිය යටතේ මෙය අදාල වේ).
5. මිලදී ගත් දිනයේ සිට මාස හයක (06) කාලයක් තුල දුරකථනයේ දියරමය ලෙස අහඹු ලෙස සිදුවන හානියකදී ස්මාර්ට් වගකීම වලංගු වේ.(අංක 12 සඳහන් ප්‍රතිස්ථාපනය කිරීමේ හා මුදල් නැවත ලබා දීමේ ප්‍රතිපත්තිය යටතේ මෙය අදාල වේ).
6. දුරකථනය සම්බන්ධව සිදු කරන පරීක්ෂණයෙන් පසු අළුත් වැඩියාවක්, ප්‍රතිස්ථාපනයක්, හෝ මුදල් නැවත ලබාදීමක් ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය අබාන්ස් සමාගම සතුය. ස්මාර්ට් වගකීම අහඹු ලෙස සිදුවන කැඩීමකදී හෝ අහඹු ලෙස සිදුවන ද්‍රව්‍යමය හානියකදී පමණක් අදාල බව තරයේ දැනුම් දේ.
7. දුරකථනය වගකීම් කාලය තුල සිදුවන හානියකදී අළුත් වැඩියාවක් කරන්නේද ප්‍රතිස්ථාපනයක් කරන්නේද යන තීරණය ගැනීමේ පූර්ණ අයිතිය අබාන්ස් සමාගම සතුය.
8. දුරකථනය වගකීම් කාලය තුල සිදුවන හානියකදී අළුත් වැඩියාවක්, හෝ ප්‍රතිස්ථාපනයක් නොමිලේ සිදු කරන්නේ එක් වරක් පමණි.
9. ස්මාර්ට් වගකීම වලංගු වන්නේ පළමු මිලදී ගැනීමේදී මුල් පාරිභෝගිකයන් පමණක් බව කරුණාවෙන් සලකන්න.
10. පළමුවර ප්‍රත්ස්ථාපනයක් සිදු වුවහොත් ප්‍රතිස්ථාපනයවූ දුරකථනයට ස්මාර්ට් වගකීම වලංගු නැත.
11. අනෙකුත් භාණ්ඩ සමඟ නොමිලේ ලැබෙන දුරකථන සඳහා ස්මාර්ට් වගකීම වලංගු නැත.

**12.ප්‍රතිස්ථාපනයක් හෝ මුදල් නැවත ලබාදීමක ප්‍රතිපත්තිය**

| මාස ගණන (මිලදී ගත් දිනයේ සිට හෝ දුරකථනය භාරගත් දිනයේ සිට) | ප්‍රතිස්ථාපනය/මුදල් නැවත ලබාදීම (Credit Note) |
|---|---|
| 0-3 | 100% |
| 4-6 | 50% |

13.මුදල් සහ ක්‍රෙඩිට් කාඩ් මඟින් සහ එක්වර ගෙවීමකදී හෝ පොළී රහිතව ක්‍රෙඩිට් කාඩ් මඟින් සිදුවන විකුණුම් වලදී ඒ සඳහා බැරපතක් (Credit Note) නිකුත් කරන අතර එම බැරපත මඟින් නවත් දුරකථනයක් මිලට ගත හැකිය. මෙම දීමනාව එක් වරක් පමණක් වලංගු වේ.

14.කුළීපිට සින්නක්කර විකුණුමකදී ප්‍රතිස්ථාපනය කිරීමේ හා මුදල් නැවත ලබා දීම අදාල ප්‍රදර්ශණාගාරයෙන් පමණක් කල යුතුය. කුළී පිට සින්නක්කර නැවත ලබා දෙන මුදල තීරණය කරනුයේ ගෙවූ මුදල පදනම් කරගෙන RCC දිනය මතය.

15.මුදල් නැවත ලබා දීම බැරපතක් මගින් සිදු වන අතර එය භාවිතා කල හැක්කේ අබාන්ස් ආයතනයෙන් නව ජංගම දුරකථනයක් මිලදී ගනීමට පමණි.

16.නිෂ්පාදකයන්ගේ වගකීම් සහතිකය සහ ස්මාර්ට් වගකීම අතර කොන්දේසි වෙනස් බව කරුණාවෙන් සලකන්න.

17.නිෂ්පාදකයන්ගේ වගකීම් සහතිකයේ ඇති කොන්දේසි අබාන්ස් ආයතනයෙන් මිලදී ගන්නා දුරකථන සඳහා ලබා දෙන වගකීම් සහතිකයේ සඳහන් වේ.

18.ස්මාර්ට් වගකීම ගැන තොරතුරු ලබා ගැනීමට www.abansgroup.com/www.buyabans.com වෙත පිවිසෙන්න.

19.කොන්දේසි සහ නීති ඇතුලත් වේ.